# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2293/77 - 2022 අගෝස්තු මස 20 වැනි සෙනසුරාදා - 2022.08.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ගොනු අංකය* : KEG/LAN/AQU/A3/01/119.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 4-3/10/2019/VE/375.

කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 2016 නාය යාමෙන් අවතැන්වූවන් යළි පදිංචි කිරීම සඳහා ඉඩම් අත්කර ගැනීම උඩුගොඩ - යටිදැරිය වත්ත කොටස සඳහා අවශ්‍ය පහත සඳහන් ඉඩම් කැබැල්ල අත්පත් කර ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර:*

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 56 බී උඩුගොඩ ග්‍රාම නිලධාරි වසමේ පහළ යටිදැරිය ගම තුළ පිහිටි කෑගල්ල මැනුම් අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක මු.පි.කෑ. උඩුගොඩ කෑ 3853 දරණ පිඹුරේ පහත උප ලේඛනයේ සඳහන් ඉඩම් කැබැල්ලට මායිම් :

01. **කැබලි අංක 1**
ඉඩමේ නම : යටිදැරිය වත්ත උඩුගොඩ කොටස; හිමිකම් කියන්නන්ගේ නම් හා ලිපිනයන්: කෑගලු වැවිලි සමාගම, අංක 310, නාවින්න, මහරගම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, අංක 375, කඩුවෙල පාර, බත්තරමුල්ල; ප්‍රමාණය: හෙක්. 0.0506.

*උතුරට* : කෑගල්ල වැවිලි සමාගම හිමිකම් කියන යටිදැරිය වත්ත; *නැගෙනහිරට* : කෑගල්ල වැවිලි සමාගම හිමිකම් කියන යටිදැරිය වත්ත සහ මාර්ගය; *දකුණට* : මාර්ගය සහ කෑගල්ල වැවිලි සමාගම හිමිකම් කියන යටිදැරිය වත්ත; *බටහිරට* : කෑගල්ල වැවිලි සමාගම හිමිකම් කියන යටිදැරිය වත්ත.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022.09.28 වැනි දින පූ.භා.10.00ට කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2022 සැප්තැම්බර් 21 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශ්‍යතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

කේ.ජී.එස්.නිශාන්ත,
ප්‍රාදේශීය ලේකම්,
කෑගල්ල.

2022 අගෝස්තු මස 15 වැනි දින,
කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීය.

EOG 08-0209




*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධිපත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වන පරිච්ඡේදය)**

7 වන වගන්තිය යටතේ දැන්වීම

ඉඩම් අමාත්‍යාංශයේ අංකය : 4-3/2/2016/A/399.
යොමු අංකය : KMB/LAN/ACQUI/2/82.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීම, අංක 2273/75 හා 2022.03.31 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද 7 වන වගන්තිය යටතේ දැන්වීමෙහි ඉඩමට හිමිකම්/අයිතිවාසිකම් කියාපෑම සඳහා සම්මුඛ විය යුතු දිනය 2022 සැප්තැම්බර් මස 19 වැනි දින ලෙස හා වන්දි මුදල් හා ඒ මුදල ගණන් බැලූ හැටි පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුත්තේ 2022 සැප්තැම්බර් මස 12 වන දිනට මත්තෙන් යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

කුසලක නානායක්කාර,
ප්‍රාදේශීය ලේකම්,
කඹුරුපිටිය.

2022 අගෝස්තු මස 16 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08-0210

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.